# පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

## උතුරු මැද පළාත - අනුරාධපුර

මෙම අධිකාරියේ සිවිල් ඉංජිනේරු තනතුරට ස්ථිර හා යාන්ත්‍රික ඉංජිනේරු තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. පහත පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. උතුරු මැද පළාතේ ස්ථිර පදිංචිකරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වන අතර, මේ සඳහා තම අයදුම්පත් 2021.09.27 දිනට පෙර පහත ලිපිනය වෙත යොමු කරන මෙන් දන්වමි.

### සිවිල් ඉංජිනේරු

**01. ශ්‍රේණිය හා වැටුප් පරිමාණය** - 55,925-10X1,375-15X1,910-98,325 (MM 1- 3-2016)

**02. වයස් සීමාව** - වයස අවුරුදු 45 ට අඩුවිය යුතුය. (දැනට රජයේ, රාජ්‍ය සංස්ථා වල හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයට උපරිම වයස් සීමාව බලනොපානු ඇත)

**03. අවම සුදුසුකම් හා සේවා අවශ්‍යතා -**

(i) (අ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් වෙනත් ඕනෑම විශ්වවිද්‍යාලයකින් ලබාගත් බී.එස්.සී. ඉංජිනේරු උපාධිය හෝ ඒ සමාන ඉංජිනේරු සුදුසුකම් ලබා තිබීම.

**සමග**

පාලම් / මහාමාර්ග ක්ෂේත්‍රයේ ඉංජිනේරුවරයෙකු වශයෙන් වසර 01 ක පළපුරුද්ද

**හෝ**

(ආ) ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ හෝ එක්සත් රාජධානියේ සිවිල් ඉංජිනේරු ආයතනයේ I හෝ II කොටස් සමත්ව තිබීම.

පාලම් / මහාමාර්ග ක්ෂේත්‍රයේ ඉංජිනේරුවරයෙකු වශයෙන් වසර 01 ක පළපුරුද්ද

**හෝ**

(ii) වසර 01 ක පළපුරුද්ද ඇති ඉංජිනේරු සුදුසුකම් සහිත වෘත්තීය ඉංජිනේරුවරයෙකු හෝ ද්‍රව්‍ය පිළිබඳ ඉංජිනේරුවරයෙකු වීම.

### යාන්ත්‍රික ඉංජිනේරු තනතුර සඳහා අදාළ වන සුදුසුකම්

**01. බාහිර අයදුම්කරුවන් - (පහත සුදුසුකම් i හෝ ii)**

(i) යාන්ත්‍රික ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු යාන්ත්‍රික ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ යන්ත්‍ර සූත්‍ර හා රථවාහන නඩත්තුව පිළිබඳ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

(ii) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළව ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු යාන්ත්‍රික ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ යන්ත්‍ර සූත්‍ර හා රථවාහන නඩත්තුව පිළිබඳව අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

(iii) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන යාන්ත්‍රික ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමකට ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**02. අභ්‍යන්තර අයදුම්කරුවන් -**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වෙනත් සුදුසුකම් හා කොන්දේසි**

✓ අයදුම්කරුවන් බඳවාගන්නා දිනට අදාළ සුදුසුකම් සියලු ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

✓ බඳවා ගන්නා දිනට වයස අවුරුදු 45 ට වඩා අඩුවිය යුතුය. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ, රජයේ අර්ධ රාජ්‍ය, පූර්ව රාජ්‍ය ආයතනයක (සංස්ථාව, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතන) වල සේවයේ නියුක්ත අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

✓ රාජ්‍ය සේවා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු / සංස්ථා / මණ්ඩල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

✓ අයදුම්කරුවන් විසින් තමාගේ ජීව දත්ත අඩංගු අයදුම්පතක් සකස්කර එවිය යුතු අතර, තමා පිළිබඳව තොරතුරු ලබා ගත හැකි දෙදෙනෙකුගේ නම් සඳහන් කර එවිය යුතුය.

✓ මෙම තනතුර හුදෙක් කොන්ත්‍රාත් පදනම මත වන අතර, වසරක කාලයක් සඳහා වේ. එහෙයින් අධිකාරියේ අභිමතය පරිදි මෙම කාලය දීර්ඝ කිරීම හෝ නොකිරීම සිදුකළ හැක.

✓ බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව 01 යි.

✓ මෙම කොන්ත්‍රාත් තනතුර සඳහා මාසිකව රු. 77,425/- ක දීමනාවක් ලබාදෙනු ලැබේ.

✓ අයදුම්කරුගේ විශේෂ සුදුසුකම් / පළපුරුද්දක් ඇත්තේ නම් ඒවා සැලකිල්ලට ගෙන ඉහළ ශ්‍රේණියක හෝ වැටුප් තලයක පිහිටවනු ලැබේ.

ඔබ මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් උතුරු මැද පළාතේ කවර ප්‍රදේශයක හෝ ඔබගේ සේවය සැපයීමට බැඳී සිටී.

බඳවා ගැනීමේ අවසාන තීරණය අධිකාරියේ සභාපති / සාමාන්‍යාධිකාරී සතුය.

**සභාපති / සාමාන්‍යාධිකාරී,**
**උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**එච්.බී. සේමසිංහ මාවත, අනුරාධපුර.**